RIGHT TO LIFE
HUMAN RIGHTS CENTRE
රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය

# ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණ යාන්ත්‍රණ ශක්තිමත් කිරීම

## දිස්ත්‍රික්ක 12ක අත්දැකීම් සහ සියල්ලන් ඇතුළත් කරගන්නා සුබසාධන ප්‍රතිසංස්කරණ සඳහා උද්දේශනය



**2024**

**සැප්තැම්බර්**

# ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණ යාන්ත්‍රණ ශක්තිමත් කිරීම

## දිස්ත්‍රික්ක 12ක අත්දැකීම් සහ සියල්ලන් ඇතුළත් කරගන්නා සුබසාධන ප්‍රතිසංස්කරණ සඳහා උද්දේශනය

RIGHT TO LIFE
HUMAN RIGHTS CENTRE

රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය

2024 සැප්තැම්බර්

2024 සැප්තැම්බර්

රචනය
චේතනා ගෝමිස්
හර්ෂ ගුණසේන

පරිවර්තන
Creative Content Consultants

ප්‍රකාශනය
රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය
56/2, පාලිත පෙදෙස
කොළඹ

mail@righttolife.lk
www.righttolife.lk

මුද්‍රණය
adARTS - Maharagama
011 3103181

# පටුන


හැඳින්වීම ........................................ 1

සමාජ රක්ෂණ යෝජනා ක්‍රම ........................................ 2

සමාජ ආධාර වැඩසටහන් ........................................ 3

කම්කරු වෙළඳපළ වැඩසටහන් ........................................ 4

අස්වැසුම් සුබසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය ........................................ 5

ක්ෂුද්‍ර මට්ටමේ ව්‍යවසායකයින් අතර ව්‍යවසායකත්ව කුසලතා වර්ධනය කිරීම සහ ඔවුන් අතර මූල්‍ය සාක්ෂරතාව වර්ධනය කිරීමේ වැඩසටහන ........................................ 15

# හැඳින්වීම

සමාජ ආරක්ෂණ ජාල යනු යම් රටක ළමුන්, කාන්තාවන්, වැඩිහිටි පුරවැසියන්, අවතැන්වූවන්, විරැකියාවෙන් පෙළෙන පුද්ගලයින් සහ අසනීප තත්වයන්ගෙන් පෙළෙන පිරිස්, පූර්ණ කාලීන ආබාධිතයන් ආදී වශයෙන් සමාජයේ අනතුරට භාජනය විය හැකි සමාජ කණ්ඩායම් ආරක්ෂා කිරීමට සහා දරිද්‍රතාව අවම කිරීමේ අරමුණෙන් රාජ්‍ය හෝ රාජ්‍ය නොවන අංශයේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක වන වැඩසටහන්ය. ආදායම හෝ පරිභෝජනය හැකියාවන් ශක්තිමත් කිරීම සමාජ ආරක්ෂණ ජාල තුළින් සිදුවේ.

ශ්‍රී ලංකාව තුළ දීර්ඝ කාලයක් තිස්සේ සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන් සැපයීමේ සම්ප්‍රදායක් ඇත. ඓතිහාසික වශයෙන් ගත්කළ සමාජ ආරක්ෂණ අවශ්‍යතා සපුරාලීමේදී විස්තෘත පවුල් සහ ප්‍රජාව ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කර ඇත.

සමාජ ආරක්ෂණ ජාල ඉතිහාසය බ්‍රිතාන්‍ය යටත් විජිත සමයේ ආරම්භ වූයේ වැවිලිකරුවන් ලංකාවේ වතු සඳහා කම්කරුවන් ඉන්දියාවෙන් ගෙන්වා ගැනීමත් සමඟය. වතු ආර්ථිකයේ ව්‍යාප්තියෙන් පසු ශක්තිමත් මධ්‍යම පන්තියක් සහ ඉහළ මධ්‍යම පන්තියක් ගොඩනැගුණි. ඒ අනුව නාගරික, ග්‍රාමීය සහ වතු ක්ෂේත්‍ර අතර ආදායම් පරතරය වැඩි වූ නිසා ආන්තික ජීවන රටාවක් ඇති අයට මුදල් ප්‍රතිලාභ ලබා දීමටත්, නිදහස් සෞඛ්‍ය සේවා රට පුරා ව්‍යාප්ත කිරීමටත්, වැටුප් ලබන්නන් සඳහා අර්ථසාධකයක් සමඟ පුළුල් සමාජ ආරක්ෂණ ක්‍රමයක් ඇති කිරීමටත් රජය තීරණය කළේය. ඒ අනුව 1898දී වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල, 1901 දී රාජ්‍ය සේවකයින් සඳහා අනිවාර්ය විශ්‍රාම වැටුප් ක්‍රමය (පීජී) හා 1931 දී මාතෘ ප්‍රතිලාභ ලබා දීම ආරම්භ විය.

වර්තමානය වන විට ශ්‍රී ලංකාව තුළ සමාජ ආරක්ෂණ ජාල 50 ට අධික ප්‍රමාණයක් ක්‍රියාත්මක වන අතර මෙම සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන් පුළුල් ලෙස කාණ්ඩ තුනකට වර්ග කළ හැක. එනම් සමාජ රක්ෂණ වැඩසටහන්, සමාජ ආධාර වැඩසටහන් සහ කම්කරු වෙළඳපොළ වැඩසටහන් වේ. මෙම ප්‍රවර්ගයන් සමස්ත සමාජ යහපැවැත්මට දායක වෙමින්, පුද්ගලයන්ට ඔවුන්ගේ ජීවිතයේ විවිධ අවස්ථාවලදී මූල්‍ය ආරක්ෂාව, ආධාර හා සහාය ලබා දීම සහ දරිද්‍රතාව අවම කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම වෙනුවෙන් විවිධ මුලපිරීම් මෙම සමාජ ආරක්ෂණ ජාලවලට ඇතුළත් වේ.

# සමාජ රක්ෂණ යෝජනා ක්‍රම

ඒ අනුව සමාජ රක්ෂණ වැඩසටහන් මගින් සාමාන්‍යයෙන් මහලු විය, මරණය, ස්ථිර ආබාධිතභාවය සහ වෙනත් ජීවන චක්‍ර සිදුවීම් වැනි හදිසි අවස්ථාවලදී ආවරණයක් ලබා දේ. මෙම වැඩසටහන් බොහෝ විට රැකියා ආශ්‍රිත වන අතර, පුද්ගලයන්ට ඔවුන්ගේ මහලු වියේදී විශ්‍රාමික ආදායම් සැපයීම ඇතුළත් වේ. විවිධ ජීවන අභියෝගවලට මුහුණ දෙන පුද්ගලයන් සඳහා මූල්‍ය ආරක්ෂණ ජාලයක් සැපයීම, ඔවුන්ගේ ජීවිතයේ විවිධ අවස්ථාවලදී ආර්ථික සුරක්ෂිතභාවය සහතික කිරීම මෙහි අරමුණයි. ඒ අනුව සමාජ රක්ෂණ වැඩසටහන් 15ට අධික ප්‍රමාණයක් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වේ. උදා:

- රාජ්‍ය සේවා විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය
- රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල
- වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප්
- සේවක අර්ථසාධක අරමුදල
- සුරක්ෂා (පාසල් සිසු රක්ෂණය)
- අග්‍රහාර (රාජ්‍ය සේවක රක්ෂණය)
- මනුසවි (විදේශක ශ්‍රමිකයන් සඳහා හඳුන්වාදෙන විශ්‍රාම වැටුප් ක්‍රමය)
- සුරැකුම (විශ්‍රාම වැටුප් නොලබන පුද්ගලයන්හට ලබාදෙන විශ්‍රාම වැටුප් ක්‍රමය)
- කලාකරු යන ආදි වශයෙන් සමාජ රක්ෂණ යෝජනා ක්‍රම මෙරට තුළ ක්‍රියාත්මක වේ.

# සමාජ ආධාර වැඩසටහන්

සමාජ ආධාර මගින් මූලික වශයෙන් අරමුණු කරන්නේ විකල්ප ආධාර නොමැති, අවදානමට ලක්විය හැකි පුද්ගලයින්ට හෝ කුටුම්භයන්ට මුදල් හෝ මූල්‍යමය නොවන වෙනත් ද්‍රව්‍යමය ආධාර ලබා දීමයි. මෙම කාණ්ඩයට වැඩිහිටියන් සඳහා ආධාර, සෞඛ්‍ය සහාය, ළමා ආරක්ෂණ මුලපිරීම්, මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් සඳහා ආධාර, පවුල් දීමනා, සහ අසනීප, අවදානම් හෝ ආබාධිත තත්ත්වයට මුහුණ දෙන අය සඳහා විශේෂයෙන් සකස් කර ඇති සුබසාධන සහ සමාජ සේවා ඇතුළු විවිධ වැඩසටහන් ඇතුළත් වේ. මෙම වැඩසටහන් සමාජ ආධාර ක්ෂේත්‍රය තුළ විවිධ අවශ්‍යතා ආමන්ත්‍රණය කරයි. මෙරට තුළ සමාජ ආධාර වැඩසටහන් 30කට අධික ප්‍රමාණයක් ක්‍රියාත්මකවන වේ. උදා:

- අස්වැසුම
- සමෘද්ධිය
- පාසල් පෙළ පොත් වැඩසටහන්
- පාසල් නිල ඇඳුම් සඳහා රෙදි බෙදා හැරීම්
- ත්‍රිපෝෂ වැඩසටහන්
- ගංවතුර සහ නියං සහනාධාර
- අබාධිත දීමනා

# කම්කරු වෙළඳපළ වැඩසටහන්

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබන ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් සහ අවදානමට ලක්විය හැකි කණ්ඩායම් සඳහා වෘත්තීය පුහුණු වැඩසටහන් ශ්‍රම වෙළඳපොළ වැඩසටහන්වලට ඇතුළත් වේ.

- සමෘධි ජීවනෝපාය සංවර්ධන වැඩසටහන්
    1. කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන්
    2. සත්ව පාලන වැඩසටහන්
    3. ධීවර අංශයේ සංවර්ධන වැඩසටහන්
    4. ක්ෂුද්‍ර ව්‍යවසාය වැඩසටහන්

- අවදානමට ලක්විය හැකි කණ්ඩායම් සඳහා ශ්‍රම වෙළෙඳපොළ වැඩසටහන්
    1. අඩු ආදායම්ලාභී පවුල්වල ආබාධිත පුද්ගලයන් සඳහා ස්වයං රැකියා ආධාර
    2. ආබාධ සහිත පුද්ගලයින් සඳහා වෘත්තීය පුහුණු වැඩසටහන්
    3. තනි මා පිය පුනරුත්ථාපන වැඩසටහන්

# අස්වැසුම් සුබසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය යටතේ 2022 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද අස්වැසුම සුභසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය ශ්‍රී ලංකාවේ ආර්ථිකමය වශයෙන් අවදානමට ලක්වී ඇති ජනගහනය එයින් මුදවා ඔවුන්ගේ ජීවන තත්ත්වය නඟා සිටුවීමේ අරමුණ ඇතිව ස්ථාපිත කරන ලද සමාජ ආධාර වැඩසටහනකි. ඒ අනුව 2022 වසරේ අයදුම්පත් කැඳවීමෙන් අනතුරුව 2023 වසරේ සිට අස්වැසුම ප්‍රතිලාභ ලබා දීම ආරම්භ විය.

අස්වැසුම ප්‍රතිලාභ ප්‍රධාන වශයෙන් කාණ්ඩ හතරක් යටතේ ලබා දීම සිදු විය. ඒ අනුව සංක්‍රාන්තික කාණ්ඩය උදෙසා රුපියල් 2500ක් ද, අවදානමට ලක් වූ පුද්ගලයන් වෙනුවෙන් රුපියල් 5000 මුදලක් ද, දිළිඳු කාණ්ඩය වෙනුවෙන් රුපියල් 7500ක් හා ඉතා දිළිඳු කාණ්ඩය උදෙසා රුපියල් 15,000ක් ලබා දීම සිදු වේ.


අස්වැසුම පළමු වටය යටතේ ප්‍රතිලාභ ලබා දීම සිදුකළ අතර අස්වැසුම දෙවන වටය සඳහා සමීක්ෂණය ජූලි මස 15 වන දා සිට 31 වන දා දක්වා පැවතිණි.

ඒ අනුව සමාජ ආරක්ෂණ ජාල සම්බන්ධව අප ආයතනය විසින් සිදුකළ පර්යේෂණයෙන් අනතුරුව දිස්ත්‍රික්ක 12ක් පුරා සමාජ ආරක්ෂණ ජාල සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවත් වූ අතර එම දැනුවත් කිරීමේ වැඩසටහන්වලින් අනතුරුව එම දිස්ත්‍රික්ක 12 පුරාවට එක් දිස්ත්‍රික්කයෙන් කුඩා කණ්ඩායම් රැස්වීම් හතර බැගින් වැඩසටහන් 48ක් පැවතිණි. මෙම වැඩසටහන් පැවත් වූ ප්‍රදේශ වනුයේ ආනමඩුව (පුත්තලම), අනුරාධපුරය, ගම්පහ, හම්බන්තොට, හැටන් (නුවරඑළිය), ඉමදූව (ගාල්ල), කන්තලේ (ත්‍රිකුණාමලය) කෑගල්ල, මාතර, මතුගම (කළුතර), මොනරාගල, හා ත්‍රිකුණාමලය වේ. ඒ අනුව එම දිස්ත්‍රික්ක පුරාවට පුද්ගලයන් 1545ක් සමාජ ආරක්ෂණ ජාල හා ක්ෂුද්‍ර ව්‍යවසායකත්වය සම්බන්ධව  දැනුවත් කෙරිණි.


මෙම දැනුවත් කිරීම් වැඩසටහන්වල අරමුණ වූයේ ලංකාව පුරා පවතින සමාජ ආරක්ෂණ ජාල, එහි ඉතිහාසය, ව්‍යාප්තිය මෙන්ම වර්තමානයේ ත්‍රියාත්මකවන අස්වැසුම වැඩසටහන පිළිබඳවත් සමාජ ආරක්ෂණ ජාල මත සමාජයේ නිර්මාණය වී පවතින යැපුම් මානසිකත්වය මෙන්ම සමාජ ආරක්ෂණ ජාල මත යැපීම වෙනුවට දුර්දුතාවයෙන් මිදීමට ක්ෂුද්‍ර ව්‍යවසායකත්වය ඉවහල් වන අයුරු මෙහි පැමිණි සිටි පිරිසට දැනුවත් කිරීමයි.

මෙලෙස සිදුකරන ලද දැනුවත් කිරීම් වැඩසටහන් තුළින් පැමිණ සිටි පිරිස දැනුවත් කිරීමෙන් අනතුරුව ඇගයීම් ආකෘතියක් බෙදාහරින ලදි. ඒ තුළින් ඔවුන් කොතරම් දුරට සමාජ ආරක්ෂණ ජාල පිළිබඳ දැනුවත් ද, සමාජ ආරක්ෂණ ජාලවල ඔවුන් ප්‍රතිලාභීන් ද යන්න ද, ප්‍රතිලාභ ලබා ගැනීමේදී මුහුණ දෙන ගැටලු සම්බන්ධව ද එම ප්‍රශ්නාවලිය ඔස්සේ අධ්‍යයනය කරන ලදි.

ඒ අනුව ප්‍රශ්නාවලිය තුළින් අසන ලද පළමු ප්‍රශ්නය වූයේ ඔවුන් මින් පෙර රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන සමාජ ආරක්ෂණ ජාල පිළිබඳ කෙතරම් දැනුවත් ද යන්නයි එම ප්‍රශ්නයට ලබා දුන් පිළිතුරු අනුව, සමාජ ආරක්ෂණ ජාල සම්බන්ධව හොඳින්ම දැනුවත් පුද්ගලයන් දිස්ත්‍රික්ක 12 පුරාවටම පුද්ගලයන් 334 ක් සිටින අතර රජයෙන් ක්‍රියාත්මක වන සමාජ ආරක්ෂණ ජාල සම්බන්ධව යම් තරමක දැනුවත් වීමක් ඇති පුද්ගලයන් 993ක් ද මෙම සමාජ ආරක්ෂණ ජාල සම්බන්ධයෙන් දැනුමක් නොමැති පුද්ගලයන් 199ක් ද ප්‍රශ්නාවලියේ මෙම ප්‍රශ්නයට පිළිතුරු සඳහන් නොකළ පිරිස 18ක් ද සිටියහ. එය ප්‍රතිශතයක් ලෙස ගත් කළ පහත පරිදි වේ.





ඔවුන් මේ වන විටත් කිසියම් හෝ සමාජ ආරක්ෂණ ජාලයක ප්‍රතිලාභීන් ද යන වග දැනගැනීම උදෙසා දෙවනුව අසන ලද ප්‍රශ්නය වූයේ ඔවුන් රජය විසින් ක්‍රියාත්මක කරන මොන යම් හෝ සමාජ ආරක්ෂණ ජාලයක ප්‍රතිලාභියෙක් ද ප්‍රශ්නයයි. එම ප්‍රශ්නයට වැඩසටහනට සහභාගි වූ පිරිස දුන් ප්‍රතිචාර අනුව, කිසියම් හෝ සමාජ ආරක්ෂණ ජාලයක ප්‍රතිලාභ ලබන්නන් 384ක් ද, එමෙන්ම ප්‍රතිලාභ නොලබන්නන් ලෙස පුද්ගලයන් 1151ක් ද එම ප්‍රශ්නය සඳහා පිළිතුරු නොසැපයූ පුද්ගලයන් ලෙස පුද්ගලයන් 9ක් ද සිටිති.




තෙවනුව ඔවුන් වෙත ඉදිරිපත් කරන ලද පැනය වූයේ ඔවුන් රජය විසින් ක්‍රියාත්මක කරන ලද කිසියම් සමාජ ආරක්ෂණ ජාලයක ප්‍රතිලාභියෙකු නම් එම ප්‍රතිලාභය කුමක් ද යන්නයි. මෙහිදී සමාජ ආධාර වැඩසටහන් කිහිපයක නම් සඳහන් කර තිබූ අතර ඒ අනුව,

| සමාජ ආරක්ෂණ ජාල | ප්‍රතිලාභීන් ප්‍රමාණය |
|---|---|
| 1. අස්වැසුම | 233 |
| 2. සමෘද්ධිය | 28 |
| 3. වැඩිහිටි දීමනා | 57 |
| 4. මහජන ආධාර | 14 |
| 5. දිළිඳු සහනාධාර | 7 |
| 6. කුඹුරු පොහොර සහනාධාර | 4 |
| 7. රෝගාබාධ දීමනාව | 14 |




ශ්‍රී ලංකාව තුළ සමාජ ආරක්ෂණ ජාල 50කට අධික ප්‍රමාණයක් පැවතුණ ද එම සමාජ ආරක්ෂණ ජාලවල ප්‍රතිලාභියෙකු ලෙස තෝරා ගැනීමේදී රජය විසින් යම්කිසි තෝරා ගැනීමේ පටිපාටියක් භාවිතා කරන අතර රජයේ තෝර ගැනීමේ පටිපාටිය යටතේ සුදුසුකම් ලබන්නන් ප්‍රතිලාභීන් වන නමුත් ජනතාව විසින් මෙම ආධාර වැඩසටහන් සඳහා ඉල්ලුම් කිරීමේදි විවිධ ප්‍රශ්නවලට මුහුණ දෙනු ලැබේ. මෙම බොහොමයක් ගැටලු ප්‍රායෝගික වශයෙන් ග්‍රාමීය මට්ටමේ පුද්ගලයන් මුහුණදෙන ප්‍රශ්න වන අතර ඒවායින් බොහෝමයක් රාජ්‍ය අංශයන් විසින් අවධානය නොදුන් ගැටලු වේ. ඒ අනුව දිස්ත්‍රික්ක මට්ටමේ සිදුකරන ලද දැනුවත් කිරීම් වැඩසටහන්වලදි එම වැඩසටහන්වලට සහභාගි වූ පිරිස් ඔවුන් විසින් සහනාධාරවලට ඉල්ලූම් කිරීමේදී මුහුණ දුන් ගැටලු සම්බන්ධව ද විමසීමක් සිදු කළ අතර එහිදී ඔවුන් ලබා දුන් පිළිතුරු අනුව ඔවුන් කොතරම් දරිද්‍රතාවයෙන් පෙලුණ ද ඔවුන්ට මෙම ආධාර ලබා ගැනීමට නොහැකි වේ. ඒ අනුව, ඔවුන් සමාජ ආරක්ෂණ ජාල සඳහා ඉල්ලුම් කිරීමේදී මුහුණ දෙන ගැටලු, ඔවුන් ප්‍රතිලාභීන් ලෙස නොතේරීමට හේතු හා වර්තමානයේ ඔවුන් මුහුණපාන ගැටලු වශයෙන් පහත දැක්වෙන කරුණු හඳුනාගන්නා ලදි.

- පවුලේ සමාජිකයකු විදේශගත වී සිටින විට රජය විසින් ලබාදෙන ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි වන අතර ප්‍රතිලාභ සඳහා අයදුම්කිරීමට ඇති හැකියාව ද අහිමි වේ.
- පෙරදී සමෘද්ධි සහනාධාර ලැබුණ ඇතැම් ප්‍රතිලාභීන්ටද අස්වැසුම හඳුන්වා

දීමෙන් අනතුරුව අස්වැසුම හා සමෘද්ධි යන ප්‍රතිලාභ ද්විත්වයම අහිමි වී ගොස් ඇත.

- සමෘද්ධි සහනාධාර ලැබී ඇති මුත් සාමාජිකයන්ට ණය ලබා ගැනීම සඳහා අත්සන් කර ඇති බැවින් එම ණය ලබාගත් පිරිස නැවත ණය නොගෙවීම හේතුවෙන් ප්‍රතිලාභීයාගේ ගිණුමෙහි ඇති මුදල් කපා හැර ඇති බව සමෘද්ධි ප්‍රතිලාභියෙකු සඳහන් කර ඇත.
- රජය විසින් ක්‍රියාත්මක කරන සහනාධාර සඳහා අයදුම් කිරීමේදී ඒ සඳහා ඇතුළත් කළ යුතු නිවැරදි තොරතුරු පිළිබඳ අවබෝධයක් බොහෝ පිරිසට නොමැති අතර එම නිසාවෙන් ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි වේ.
- අස්වැසුම පළමු වටය සඳහා බොහෝ පිරිසක් අයදුම් කළද බොහෝ පිරිසක් ප්‍රතිලාභ සඳහා තේරී නැත.
- බොහෝ පිරිසක් රජය මඟින් ක්‍රියාත්මකවන සුභසාධක ප්‍රතිලාභ පිළිබඳ දැනුවත් වී නැත.
- රුපියල් 15,000කට අධික වැටුපක් උපයන පුද්ගලයන්ට ප්‍රතිලාභ සඳහා අයදුම් කිරීමට නොහැකි වන මුත්, ඔවුන් උපයන වැටුප ආර්ථිකය සමග සසඳා බලන කල ප්‍රමාණවත් නොවේ.
- මෙම දැනුවත් කිරීම් වැඩසටහන් සඳහා සහභාගි වූ ඇතැම් පිරිස්වල පවුලේ සාමාජිකයෙකු රාජ්‍ය සේවයේ නියුතු නම් ඔවුන්හට රජය විසින් ක්‍රියාත්මකවන කිසිදු ප්‍රතිලාභයකට අයදුම් කළ නොහැක.
- ඇතැම් පිරිස් මෙම ප්‍රතිලාභ අයදුම් කිරීමට ගිය අවස්ථාවේ දී රාජ්‍ය නිලධාරීන් ඔවුන්ට සහය නොදී අයදුම් කිරීමට නොහැකි බව පවසා ඇත. ඇතැම් පුද්ගලයන්ව ප්‍රාදේශීය ලේකම් කාර්‍යාලයෙන් නොසලකා හැර ඇත.
- ගම්පහ දිස්ත්‍රික්කයේ ඇතැම් පුද්ගලයන්ට ඉඩම්වල අයිතිය නොමැතිකමින් සහනාධාර ලබා ගැනීමට එය ප්‍රශ්නයක් වී ඇත.
- පුද්ගලයන් ප්‍රතිලාභ සඳහා අයදුම් කිරීමේදී ඔවුන්ගේ වත්කම් ගැන සලකා ඔවුන්ට අයදුම් කිරීමට සුදුසුකම් නැති බව රාජ්‍ය නිලධාරීන් පවසා තිබේ.
- ඇතැම් සුළුතර ජාතීන් හට සිංහල භාෂාව පිළිබඳ නොදැනුවත්කම හේතුවෙන් භාෂාමය ගැටලු නිර්මාණය විය.
- ඇතැම් නිවාසවල පවුල් ඒකක කිහිපයක් ජීවත්වන විට අනු පවුල්වලට ප්‍රතිලාභ ලබා ගැනිමේ දි ගැටලු ඇති විය.
- ඇතැම් ද්‍රවිඩ පුද්ගලයන් පවසන ආකාරයට ජාතිකත්වය මත ඔවුන්ට රැකියා අවස්ථා මෙන්ම සහනාධාර ලබා දීමද රාජ්‍ය නිලධාරීන් නොසලකා හරිති.
- වතුකරයෙන් පිට සේවයකරන ජනතාව සඳහා කිසිදු සහායක් රාජ්‍ය නිලධාරීන් ලබා නොදීම නිසාවෙන් ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි වූ අය ද සිටිති.

- ජාතික හැඳුනුම්පත් නොමැති පුද්ගලයන් හට ඇතැම් සහනාධාර සඳහා අයදුම් කිරීමේදී ගැටලු ඇති වීය. එම නිසාවෙන්ම ප්‍රතිලාභියෙකු සුදුසුකම් ලැබුවේ නැත.

- ඇතැම් පුද්ගලයන් හට සහනාධාර ලබා ගැනීමේදී විශාල මුදලක් ගමනාගමන කටයුතු සඳහා වැය කරමින් දුර බැහැර යාමට සිදුවන නිසා, කාලය විශාල වශයෙන් වැය වේ. ඔවුන්ට පෝලිම්වල විශාල කාලයක් රැඳී සිටීමට සිදු වීම, ලියකියවිලි කටයතු සඳහා මුදල් වැය වීම වැනි අපහසුතා තිබේ.

- ඇතැම් රාජ්‍ය නිලධාරීන් සමීක්ෂණයට සහය නොවීම නිසාවෙන් සමීක්ෂණයට සහභාගි වූ පිරිස එම ග්‍රාමයේ වාසය කරන පුද්ගලයන්ගේ වත්කම්, ආදායම් පිළිබඳ නොදැනීම හේතුවෙන් අස්වැසුම ලබා ගැනීමට නොහැකි වූ බව ඇතැමෙක් පවසා ඇත.

- පෙරදී සමෘද්ධිය ලැබුණ ද අස්වැසුම හඳුන්වා දීමෙන් පසුව කිසිදු සහනාධාරයක් නොලැබුණු අය සිටිති.

සහභාගි වූ පිරිස් ඔවුන් විසින් සහනාධාරවලට ඉල්ලුම් කිරීමේදී මුහුණ දුන් ගැටලු සම්බන්ධව ද විමසීමක් සිදු කළ අතර එහිදී ඔවුන් ලබා දුන් පිළිතුරු අනුව ඔවුන් කොතරම් දරිද්‍රතාවයෙන් පෙලුණ ද ඔවුන්ට මෙම ආධාර ලබා ගැනීමට නොහැකි වේ. ඒ අනුව

- මෙම වැඩසටහන තුළින් ලබාගත් දැනුම සිය ආර්ථික තත්ත්වය යහපත් කර ගැනීමට යොදාගන්නා බවත් මෙම දැනුම තවත් පුද්ගලයන් හා බෙදා ගන්නා බවත් සඳහන් කර ඇත.

- බොහෝ පිරිසක් ස්වයං රැකියාවක් ආරම්භ කිරීමට බලාපොරොත්තුවක් ඇති බව සඳහන් කර ඇති අතර මෙම වැඩසටහන් තුළින් ලබාගත් දැනුම ඒ සඳහා භාවිතා කරන බව සඳහන් කර ඇත.

- පැමිණ සිටි අයෙකුගේ යෝජනාවක් වූයේ කණ්ඩායමක් තෝරාගෙන ඔවුන්හට ව්‍යවසායකත්ව පුහුණුවක් ලබා දී එම කණ්ඩායම විසින් ආරම්භ කරන ලද ව්‍යාපාරයේ ලාභ කණ්ඩායම් අතර බෙදාගත හැකි පිළිවෙළක් සකස් කර දෙන ලෙසයි.

- මෙවැනි දැනුවත් කිරීමේ වැඩසටහන් ග්‍රාමීය මට්ටමෙන් තවදුරටත් පවත්වන මෙන් බොහෝ පිරිසක් ඉල්ලා ඇත.

- මින් ඉදිරියට ඔවුන් හට අසාධාරනයක් ඇති වුවහොත් ඒ සඳහා ක්‍රියාමාර්ග ගන්නා බවත්, එමෙන්ම, ඔවුන් වෙනුවෙන් එවැනි ආයතන ඇති බවට දැනුවත් වූ බවත් බොහෝ පිරිසක් පවසා ඇත.

- මෙම වැඩසටහන් සඳහා සහභාගි වූ පිරිස් අතර දැනටමත් ව්‍යවසාකයන් ලෙස කටයුතු කරන පිරිස් සහ ව්‍යවසායකයකු වීමට අවශ්‍ය පිරිසට මූලිකව අමුද්‍රව්‍ය හා උපකරණවල ගැටලු පවතින බව සඳහන් කර ඇත.

- එමෙන්ම ව්‍යවසායකත්වය සම්බන්ධයෙන් පුහුණුවල අවශ්‍යතාවයක් පවතින බවත් එවැනි පුහුණුවක් ලබාදෙන ලෙසත් ඉල්ලා ඇත.

- බැංකුවක් හරහා අඩු පොළී ණය හෝ ගොවි ණය ලබාගෙන ඵලදායිතාවක් අත් කරගන්නා බව ඇතැම් පුද්ගලයන් පවසා ඇත.

- ග්‍රාමයේ ජීවත්වන අඩු ආදායම්ලාභීන්ගේ ආර්ථිකය ශක්තිමත් කර ගැනීම උදෙසා ස්වයං රැකියා අවස්ථා ඇති කර දෙන මෙන් ඉල්ලා ඇත.

- එකම පාර්ශවයන්ටම දිගු කාලීනව ප්‍රතිලාභ ලබා දෙනවා වෙනුවට සීමිත කාල සීමාවකට වැඩි පිරිසකට ප්‍රතිලාභ ලබා දී ඔවුන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීම වඩාත් යෝග්‍යවන බව ඇතැම් පුද්ගලයන්ගේ අදහස විය.

මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් අතරතුර ඔවුන්හට සමාජ ආරක්ෂණ ජාල ආශ්‍රිතව පවතින ගැටලු පිළිබඳ පොදු සාකච්ඡාවක් පැවැත්විණි. එම අවස්ථාවේදී පැනනැගුණු අදහස් හා ගැටලු වූයේ,

- රජය විසින් යම් සමාජ ආරක්ෂණ වැඩසටහනක් සිදු කරන විට ඒ පිළිබඳව රාජ්‍ය නිලධාරීන් විසින් ජනතාව දැනුවත් නොකිරීම නිසා බොහෝ පිරිසකට එම වැඩසටහන් පිළිබඳ නිසි අවබෝධයක් නැති වීම.

- ඇතැම් ග්‍රාම නිලධාරි වසම්වල සංගණන නිලධාරීන් නිවෙස් වෙත ගොස් ලබාගත් තොරතුරු නිවැරදි ලෙස සටහන් නොකිරීම නිසා ප්‍රතිලාභ හිමිවිය යුතු පුද්ගලයන් හට හිමිකම් ප්‍රතිලාභ නොලැබීම.

- රජයෙන් ලබාදෙන ආධාරමත යැපීමට නොගොස් තම ආර්ථිකය ශක්තිමත් කර ගැනීමට උත්සාහ කිරීමට පෙළඹවීම සඳහා මෙවැනි දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම හා ක්ෂුද්‍ර ව්‍යවසාය හා ස්වයං රැකියා දියුණු කිරීම සඳහා හෝ ආරම්භ කිරීම සඳහා රජයේ සහාය ලබා දිය යුතු බව.

- පසුගිය කාලයේ සුබසාධන ප්‍රතිලාභයක් ලබාදීමේදී ග්‍රාම නිලධාරීන් එම ප්‍රතිලාභ හිමි පිරිසගෙන් ප්‍රදේශයට යම් පොදු සේවාවක් ඉටු කරගෙන ඇති අතර එම නිසා එම ප්‍රදේශවල පොදු ස්ථාන, මාර්ග දෙපස අලංකාරව තිබූ බව.

- ග්‍රාම නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන් අස්වැසුම ප්‍රතිලාභ වැඩසටහන සම්බන්ධවයෙන් වැඩි අවධානයක් නොදක්වන බව මෙම වැඩසටහන් තුළ දී සඳහන් වූ කරුණුවලින් හෙළි විය.

- රජය විසින් විවිධ වූ රෝග අබාධ සහිත පුද්ගලයන්ට ලබා දෙන අබාධිත දීමනා මේ වන විට ඇතැමුන්ට නොලැබෙන බව.

- ග්‍රාම නිලධාරීන් විසින් ග්‍රාමයේ ජීවත්වන පුද්ගලයන්ගේ ආදායම් තත්ත්ව උපකල්පනය කිරීම මත අදාල සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ වැඩසටහනට සුදුසුකම් නොලබා තිබීම.

- ඇතැම් පුද්ගලයන්ගේ සාක්ෂරතාවය ද පහළ මට්ටමක පවතින බැවින් එය ගැටලු සහගත තත්ත්වයන් ඇති කිරීමට හේතු වී ඇත.

- සමීක්ෂණයට සහභාගි වූ බොහෝ නිලධාරීන් සමීක්ෂණය සිදුකර ඇත්තේ ක්‍රමානුකූලව සමීක්ෂණය සිදු කිරීමට වඩා වැඩි ප්‍රමාණයක් සමීක්ෂණය සිදු කර වැඩි මුදලක් ඉන් ඉපයීමටයි.

- අස්වැසුම සමීක්ෂණයේදී හිතවත්කම් මත නුසුදුස්සන්ට දත්ත වෙනස්කර ප්‍රතිලාභ ගැනිමට සමීක්ෂණයට සහභාගි වූ නිලධාරීන් සහාය දී ඇති අතර ප්‍රතිලාභ ලැබීමට අවශ්‍ය පුද්ගලයන්ට දත්ත නිවැරදිව සටහන් නොකිරීම මත එම ප්‍රතිලාභ නොලැබීම

- ගෘහ මූලිකයා හෝ වැඩිහිටියකු නිවසින් බැහැරව ගොස් ඇති අවස්ථාවන්වලදී නිවසෙහි පසු වූ ළමුන්ගෙන් තොරතුරු ලබාගෙන ඇති අතර එබැවින් නිවැරදි තොරතුරු සටහන් නොවීම හේතුවෙන් ඔවුන්ගෙන් බොහෝ පිරිසකට අස්වැසුම අහිමි වීම.

- එකම ගෘහස්ථයේ පවුල් ඒකක කීපයක් ලියාපදිංචිව පසුවෙද්දී වුවද සමීක්ෂණයට පැමිණි නිලධාරීන් එක් පවුල් ඒකකයකින් පමණක් තොරතුරු සටහන් කරගැනීම සහ අනෙක් පවුල් ඒකකයේ වාසය කරන්නන්ගේ දත්ත නිවසේ සෙසු අයගෙන් අසා සටහන් කරගැනීම නිසා අනෙක් පාර්ශවයන්ට වරප්‍රසාද අහිමි වීම.

- ජාතික හැඳුනුම්පත නොමැති හා වැඩිහිටි හැඳුනුම්පත ඇති අයට මෙම සමීක්ෂණයේ දී ඉල්ලුම් කිරීමට අවස්ථාවක් ලබා නො දීම නිසා අදාළ ප්‍රතිලාභ නොලැබීම

- ඇතැම් ස්වයං රැකියා (විසිතුරු මසුන් ඇති කරන මත්ස්‍ය වෙළඳාම) ආරම්භ කිරීමේදී පළාත් පාලන මන්ත්‍රී මගින් පළාතේ ඇමැතිවරයාගේ හෝ මන්ත්‍රීවරයාගේ නිල මුද්‍රාව සහිත අත්සන ලබාගෙන නොමැතිනම් එම ව්‍යාපාර පවත්වාගෙන යෑමට නොහැකි තත්ත්වයක් තිබීම.

- විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සිටින පවුල්වල සාමාජිකයකු රජයේ සුළු රැකියාවක නිරත වනවිට එම විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයාට සමාජ සේවා දෙපාර්තුමේන්තුවෙන් ලබා දුන් ආධාර මුදල කප්පාදු කිරීම.

- අස්වැසුම සම්බන්ධව සිදු වූ අසාධාරණකම් හා ගැටලු සම්බන්ධව සමෘද්ධි නිලධාරීන්ට වාර්තා කිරීමට යාමේ දී ඔවුන් එම වැඩසටහනෙන් ඉවත් වී ඇති බව කියමින් ප්‍රාදේශීය ලේකම් කාර්‍යාලයට යොමු කර ඇති අතර ඔවුන් ද එම ගැටලු පිළිබඳ අවධානය යොමු කර නැත.

- සමෘද්ධි බැංකු නිලධාරීන් විසින් ප්‍රතිලාභ අදාළ ප්‍රතිලාභීන්ට ලබා නොදී එම මුදල් මාස කීපයක් රඳවා තබාගන්නා බවට බොහෝ පුද්ගලයන් ප්‍රකාශ කර ඇත. එමෙන්ම මෙම මුදල් ලබා ගැනීමට යාමේදී එකම දිනක සැවොම ප්‍රතිලාභ ලබා ගැනීමට පැමිණෙන බැවින් දැඩි තදබදයක් ඇති වීම.

- සහනාධාර මුදල් මාස කිහිපයක් ගිණුමේ තැන්පත් වීමට ඉඩ හැර එම මුදල්

ඵලදායි ක්‍රියාවකට එනම් ස්වයං රැකියාවක් ඇරඹීම සඳහා ලබා ගැනීමට යාමේදී එම මුදල් එකවර නිදහස් නොකිරීම.

- එක් නමකින් දෙදෙනකු සිටින අවස්ථාවකදී, ප්‍රතිලාභය ලැබීමට සුදුසු පුද්ගලයාට ප්‍රතිලාභය හිමි වී ප්‍රතිලාභය ලැබීමට නුසුදුසු පුද්ගලයන් හට ප්‍රතිලාභ නොලැබුන ද වැරදි අවබෝධය හේතුවෙන් විරෝධතා පළ කිරීම.

- වතු ජනතාවට ජාතික හැඳුනුම්පත් හා උප්පැන්න නොමැති වීම හා එම ලියකියවිලි සකස් කර ගැනීමට යාමේදී භාෂාමය ගැටලු හා මූල්‍යමය ගැටලු පවතින අතර ඒ සඳහා කළ යුතු ක්‍රියාවලින් පිළිබඳ දැනුවත් නොවීම.

- වතු නායකයින් ඔවුන් යටතේ සිටින පිරිසට පමණක් රජයෙන් දැනුම් දෙන පණිවිඩ ආදිය දැනුවත් කරන අතර අනෙක් වතු ජනතාව ඒ පිළිබඳ නොදැනුවත් වීම.

- බොහෝ වතු ජනයාගේ නිවස්වල පවුල් දෙකක් හෝ ඊට වඩා වැඩි පිරිසක් ජීවත් වන අතර සමීක්ෂණයට පැමිණි නිලධාරීන් එක් පවුලක් පමණක් ලියාපදිංචි කර ඇත. එබැවින් අනෙක් පවුලට අස්වැසුම ලැබී නැත.

- ඇතැම් අස්වැසුම හිමිවන ප්‍රතිලාභීන් අස්වැසුම ලබාගැනීමට බැංකුවට යාමේදී ගමනාගමන කටයුතු සඳහා අධික පිරිවැයක් වැයවෙන අතර හිමිවන දීමනාව වැයවෙන මුදල් හා සමග සසඳන කළ ප්‍රමාණවත් නොවීම.

- අස්වැසුම ලබාගැනීමට යාමේදී භාෂාමය ගැටලු පවතින පුද්ගලයන්, එනම් සිංහල නොවන අය හට සිංහල දන්නා පුද්ගලයෙකු සමඟ යෑමට සිදුවන අතර එවිට එම පුද්ගලයන් හට මුදල් ගෙවීමට සිදු වීම.

- අස්වැසුම නොලැබුණු පිරිස් අභියාචනා කිරීමට කළ යුතු දෑ සම්බන්ධව දැනුවත් නොවීම හා අභියාචනා භාර දීමට යෑමේදී රාජ්‍ය නිලධාරීන්ගේ අකාර්යක්ෂමතාව පිළිබඳ කලකිරීමක් ඇති වීම.

- මෙම සමීක්ෂණය සිදු කිරීමේ දී මෘදුකාංගයෙහි (ජංගම)දුරකථන අංකය හා ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කිරීම අත්‍යවශ්‍ය වන අතර මේ නිසාවෙන් ප්‍රශ්නාවලියේ ඉදිරියට යාමට නොහැකි වේ. දත්ත සටහන් කළ පුද්ගලයන් දත්ත සටහන් කිරීම එහිදී නවතා ඇත. මහළු පිරිසට, ආබාධිත හා ඉතා දිළිඳු පිරිස් සඳහා දුරකථන අංකයක් නොමැතිනම් ප්‍රශ්නාවලියෙන් ඉදිරියට යාමට නොහැකි වීම. එමෙන්ම හැඳුනුම්පතක් නොමැති අයට ද මෙම ප්‍රශ්නාවලියෙන් ඉදිරියට යාමට නොහැකි වීම මත අස්වැසුම අහිමි වී ඇත.

- අස්වැසුම ආශ්‍රිතව විමසීම් කිරීමට රාජ්‍ය කාර්‍යාලවලට ගිය විට නම් කෙරුණු නිලධාරියෙකු නොමැති හෙයින් නිවැරදි තොරතුරු ලබා ගැනීමට නොහැකි වීම.

- ඇතැම් ධීවර පවුල් හොඳ ආර්ථික මට්ටමක් අත්කරගෙන සිටියද සමාජ ආරක්ෂණ ජාලවලින් ඉවත් වීමට අකමැති වීම.

- අධාර මත යැපෙන බොහෝ පුද්ගලයන් ඊට අනුගත වීම තුළින් රැකියාවක

නියැළීමට අකමැති වීම.

- සමාජ ආරක්ෂණ ජාල□ යන වචනය පිළිබඳව රාජ්‍ය නිලධාරීන් මෙන්ම ගම් වැසියන් තුළ දැනුවත්භාවයක් නොමැති වීම හා සමාජ ආරක්ෂණ වැඩසටහන් 30කට අධික ප්‍රමාණයක් ඇති බව රාජ්‍ය නිලධාරීන් නොදැන සිටීම.

මේ අනුව තෝරාගත් දිස්ත්‍රික්ක 12 පුරාවට පවත්වන ලද කුඩා කණ්ඩායම් රැස්වීම් 48 ඔස්සේ සමාජ ආරක්ෂණ ජාල සම්බන්ධයෙන් ජනතාවට පවතින දැනුම පිළිබඳ තක්සේරුවක් සිදු වූ අතර ඒ අනුව පුද්ගලයන් 1545 අතර හොඳින් දැනුවත් පුද්ගලයන් 22%ක් ද, තරමක් දැනුවත් පුද්ගලයන් 64%ක් ද, දැනුමක් නොමැති පුද්ගලයන් 13% ක් ද සිටින අතර විශේෂයෙන් ඔවුන් සමාජ ආරක්ෂණ ජාලී යන වචනය පිළිබඳ දැනුමක් නොමැති බවත් මෙම වැඩසටහන් තුළින් නිරීක්ෂණ විය. එමෙන්ම මෙම වැඩසටහන් තුළින් නිරීක්ෂණය වූයේ තවමත් අවශ්‍ය පිරිසක් සමාජ ආරක්ෂණ ජාලවල පිහිට බලාපොරොත්තුවෙන් සිටින බවය. මෙම වැඩසටහන්වලට සහභාගි වූ ඇතැම් පිරිස් ක්ෂුද්‍ර ව්‍යාපාරවල නියැලී සිටින අතර ඔවුන් මුහුණපාන පොදු ගැටලු කිහිපයක් පවතී. එනම් අමුද්‍රව්‍ය මිළදී ගැනීම් හා සපයා ගැනිම් පිළිබඳ ගැටලු, ප්‍රාග්ධානය සපයා ගැනීම සම්බන්ධ ගැටලු, පුහුණු වැඩසටහන්වල අවශ්‍යතාව, ඔවුන්ගේ නිෂ්පාදන සඳහා හොඳ වෙළඳපළක අවශ්‍යතාව ආදියයි. ඒ අනුව, සමාජ ආරක්ෂණ ජාලවල යැපෙන්නන් නොවී සිය ස්වෝත්සහයෙන් ආර්ථිකය ශක්තිමත් කිරීමට උත්සහ දරන පුද්ගලයන් තව දුරටත් ධෛර්යවත් කරමින් ඔවුන්ට අවශ්‍ය සහාය ලබා දීම සිදුකළ යුතු අතර මෙම සමාජ ආරක්ෂණ ජාල මගින් දරිද්‍රතාවය අවම කිරීම කළ නොහැකි බව රජය ඇතුළුව සමස්ත සමාජයම අවබෝධ කර ගත යුතුය.

# ක්ෂුද්‍ර මට්ටමේ ව්‍යවසායකයින් අතර ව්‍යවසායකත්ව කුසලතා වර්ධනය කිරීම සහ ඔවුන් අතර මූල්‍ය සාක්ෂරතාව වර්ධනය කිරීමේ වැඩසටහන

මෑත කාලයේ ශ්‍රී ලංකා ආර්ථිකය අර්බුද දෙකකට මුහුණ දුන්නේය. එකක් කදඩසා*19 වසංගතය වූ අතර අනෙක ආර්ථික බංකොලොත්භාවයයි. ඇත්ත වශයෙන්ම, පළමුවැන්න විසින් දෙවැන්න අවුලුවාලන ලදි. මෙම ව්‍යසන දෙකෙන්ම ශ්‍රී ලංකාවේ ව්‍යවසායන් පීඩාවට පත් විය.

කොවිඩ්-19 වයිරසයේ ශ්‍රී ලංකාවේ පළමු රෝගියා 2020 ජනවාරි මාසයේදී වාර්තා විය. ඇතැම් ණය (ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර, වෙනත් රටවලින් ලබාගත් ණය, වාණිජ බැංකු හෝ ආයතනික ණය දෙන්නන්ගෙන් ලබාගත් විදේශ මුදල් ණය, මුදල් හුවමාරු හැර) සඳහා ගෙවිය යුතු ඕනෑම වාරික සහ පොලී ගෙවීමක් 2022 අප්‍රේල් 12 වැනි දින සවස 5 න් පසු අත්හිටුවන බව ශ්‍රී ලංකාව නිවේදනය කළේය. එම ණය සේවාවන් සාමාන්‍ය පොලී අනුපාතික යටතේ ණය මුදලට එකතු කරන ලදි.

එය රාජ්‍යයේ බංකොලොත්භාවය ප්‍රකාශ කිරීමකි. එතැන් පටන් ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ විස්තීරණ අරමුදල් පහසුකම් ගිවිසුමකට එළඹ ඇති අතර මේ වන විට ඩොලර් බිලියනයක පමණ ණය වාරික තුනක් ලබා ගැනීමට සමත් වී ඇත.

ෂඑඡ අවධානය යොමු කරන්නේ ගැටලුවේ මූලික හේතුව වන මූල්‍ය ස්ථායීකරණය කෙරෙහි ය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වර්ධන උපාය මාර්ග පිළිබඳ ප්‍රශ්නය ආමන්ත්‍රණය කරන්නේ නැත. අයවැය හිඟයට අමතරව ගෙවුම් ශේෂයේ හිඟය පිළිබඳ සදාකාලික ගැටලුවකට රට මුහුණ දී සිටින අතර එහි ප්‍රධාන ප්‍රශ්නය වන්නේ අඛණ්ඩ වෙළෙඳ හිඟයයි. මෑත වසරවල ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ වර්ධනයට හේතු වූයේ රජය විසින් ණයට ගත් මුදල් මත ආරම්භ කරන ලද යටිතල පහසුකම් ව්‍යාපෘතිවල ඉදිකිරීම්ය. මෙම ප්‍රශ්නය මඟහරවා ගැනීම සඳහා ප්‍රතිපත්ති මට්ටමින් රජය ආනයන ආදේශන උපාය මාර්ගවලට වඩා අපනයන ප්‍රවර්ධන උපාය මාර්ග කෙරෙහි අවධානය යොමු කළ යුතුය. ආර්ථික වර්ධනයේ ප්‍රධාන අංගයක් විය යුත්තේ රටේ අපනයනය වන අතර එමඟින් වෙළෙඳ හිඟය සහ ආර්ථික වර්ධනය යන ප්‍රශ්න දෙකටම අවසානයේ විසඳුම් ලැබෙනු ඇත.

එබැවින් අපනයන ප්‍රවර්ධනයට ශ්‍රී ලංකාව සහාය දිය යුතුය. මෙය සාක්ෂාත් කර ගැනීම සඳහා බිම් මට්ටමේ ව්‍යවසායකයින්ට සහාය විය යුතුය. ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ වර්ධනය බස්නාහිර පළාත දෙසට නැඹුරු වී ඇත. ඒ නිසා මුළු රටේම ව්‍යවසායකයන්ට සහාය වීම අවශ්‍යය.

ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය (SME) ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයෙන් 52%ක් පමණ වේ. ඔවුන් රැකියාවලින් 45% ක් පමණ සපයයි. 2013 වන විට, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (MSME) අංශය ශ්‍රම බලකායෙන් 75%කට රැකියා සපයන බව සමහර අධ්‍යයනවලින් හෙළි විය. කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කරන ලද ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුව ඒවා පහත දැක්වෙන පරිදි අර්ථ දක්වා ඇත.

වගුව 1 ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අර්ථ දැක්වීම

| **ප්‍රමාණය / අංශය** | **නිර්ණායකය** | **මධ්‍යම** | **කුඩා** | **ක්ෂුද්‍ර** |
|---|---|---|---|---|
| නිෂ්පාදන අංශය | වාර්ෂික ආදායම | රු.මි. 251-750 | රු.මි 16-250 | රු.මි. 15ට අඩු |
| | සේවක සංඛ්‍යාව | 51-300 | 11-50 | 10ට අඩු |
| සේවා අංශය | වාර්ෂික ආදායම | රු.මි. 251-750 | රු.මි 16-250 | රු.මි. 15ට අඩු |
| | සේවක සංඛ්‍යාව | 51*300 | 11*50 | 10ට අඩු |

මෙම නිර්වචනය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ ක්ෂුද්‍ර ව්‍යවසායන් සඳහා විවිධ ගිණුම්කරණ ප්‍රමිතිවලට අදාළ වරලත් ගණකාධිකාරී ආයතනයේ නිර්වචනයට අනුකූල වේ.

කෙසේ වෙතත්, ඔවුන් සියල්ලෝම ශ්‍රී ලංකාවේ අපනයන සඳහා දායක වන්නේ 5% කට වඩා අඩු ප්‍රමාණයකි. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ ව්‍යාපාර අසාර්ථකත්වය ඉතා ඉහළ මට්ටමක පවතින අතර ඔවුන්ගේ අසාර්ථකත්වයට ප්‍රධානතම හේතු වන්නේ මූල්‍ය සාක්ෂරතාව නොමැතිකම සහ වාර්තා තබා ගැනීම සම්බන්ධ ගැටලුය. ඊට අමතරව ක්‍රමක්‍රමයෙන් දියුණු වෙමින් තිබුණත් රටේ සංස්කෘතිය තුළ ව්‍යවසායකයින්ට පිළිගැනීමක් නැත. එබැවින් ව්‍යවසායකත්වයට පිවිසෙන අය පාසල් හෝ විශ්ව විද්‍යාලවලින් ගිලිහී ගිය අය වන අතර එය ලොව පුරාම එසේ විය හැකිය.

ඔවුන් ආර්ථිකයට කරන දායකත්වය සලකා බලන විට මෙරට කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ පුනර්ජීවනයට දායක වීම අතිශයින් වැදගත් දෙයකි. MSME වල පවතින එකම විස්තීර්ණ දත්ත සමුදාය වන්නේ, 2013/14දී එවැනි ව්‍යවසායන් 1,019,681ක් වාර්තා කළ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ජාතික ආර්ථික සංගණනය වේ.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2021 වසරේ දී ශ්‍රී ලංකාවේ මූල්‍ය සාක්ෂරතාව පිළිබඳ සමීක්ෂණයක් සිදු කර ඇති අතර එය ස්ටෑන්ඩඩ් ඇන් පුවර් විසින් ලොව පුරා මූල්‍ය සාක්ෂරතාව සම්බන්ධයෙන් නිර්මාණය කරන ලද ප්‍රමිතිය මත පදනම් විය. මූල්‍ය

සාක්ෂරතාව යනු දැනුවත් මූල්‍ය තීරණ ගැනීමට සහ මූල්‍ය යහපැවැත්ම සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය දැනුම, ආකල්ප සහ හැසිරීම්වල එකතුව ලෙස අර්ථ දක්වා ඇත. එහි සොයාගැනීම් මත පදනම්ව, ශ්‍රී ලංකාවේ වැඩිහිටියන්ගෙන් සියයට 57.9කට මූල්‍ය සාක්ෂරතාව ඇති බව වාර්තා විය.

ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායන් කෙරෙහි බහුවිධ අර්බුදවල බලපෑම යන මාතෘකාව යටතේ සිදු කරන ලද අධ්‍යයනයකදී, උපදේශන සහ ව්‍යාපාරික පුහුණු සේවා හරහා ව්‍යවසායකත්ව සංවර්ධනය සිදු කළ යුතු බව යෝජනා විය. හොඳින් සැලසුම් කරන ලද ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන් හරහා වීඑඃ අතර ව්‍යවසායකත්ව කුසලතා වර්ධනය කිරීමේ හැකියාව පෙන්වා දෙන ලදි.

රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය විසින් ක්ෂුද්‍ර මට්ටමේ ව්‍යාපාරවල නියැලී සිටින හෝ නිරත වීමට අදහස් කරන සමාජ ආරක්ෂණ ජාල ප්‍රතිලාභීන් සහ අදාළ රාජ්‍ය සේවකයින් ක්ෂුද්‍ර ව්‍යවසායකයින් 40ක පිරිසකගෙන් සමන්විත වැඩසටහන් 48ක් දිවයින පුරා පවත්වන ලදි. එහි එක් ප්‍රධාන අභිප්‍රායක් වූයේ අස්වැසුම ප්‍රතිලාභීන් වැඩි කාලයක් එම වැඩසටහන මත යැපීමෙන් වළක්වා ව්‍යවසායකත්වයට යොමුවීම දිරිමත් කිරීමයි. ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණ ක්‍රම පිළිබඳව රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය විසින් සිදු කරන ලද සවිස්තරාත්මක අධ්‍යයනයක් ද ඔවුන් වෙත ඉදිරිපත් කරන ලදි. ඉන්පසුව ව්‍යවසායකත්වය පිළිබඳ හැඳින්වීමක් ඉදිරිපත් කරන ලද අතර එමඟින් එම විෂයය සඳහා සහභාගිවන්නන්ගේ උනන්දුව වැඩි කරන ලදි.

ඉන් අනතුරුව, ආරම්භකයින්ට මෙන්ම දැනටමත් ව්‍යාපාරවල නිරතව සිටින ව්‍යවසායකයින්ට ප්‍රයෝජනවත් වන පහත සඳහන් ක්ෂේත්‍ර ආවරණය කරමින් සවිස්තරාත්මක සාකච්ඡා සිදු කරන ලදී.

- ආකල්ප
- මූල්‍යමය දෘෂ්ටිකෝණයෙන් සහ අලෙවිකරණ ඉදිරිදර්ශනයෙන් නිෂ්පාදනවල මිල නියම කිරීම
- සන්නාමය
- දළ ලාභය සහ ශුද්ධ ලාභය ගණනය කිරීම සහ ලාභයේ වැදගත්කම
- මූල්‍ය සාක්ෂරතාව
- වියදම් කළමනාකරණය
- මුදල් ප්‍රවාහ කළමනාකරණය
- පාරිභෝගික කළමනාකරණය සහ සැපයුම් කළමනාකරණය
- බැංකු සහ ණය කළමනාකරණය
- ණය සඳහා ඵලදායී පොලී අනුපාත ගණනය කිරීම්

ෂබධ වාර්තාව කාන්තා ව්‍යවසායකයින් සංඛ්‍යාව වැඩි කිරීමට නිර්දේශ කර තිබිණි. රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානයේ වැඩසටහන්වලට සහභාගී වූවන්ගෙන් බහුතරය කාන්තාවන් බව නිරීක්ෂණය විය.

ෂබධ වාර්තාව යෝජනා කරන පරිදි වීඑෑ සඳහා අර්බුද කළමනාකරණය, ව්‍යාපාර අඛණ්ඩ සැලසුම් සහ තිරසාර මුලපිරීම් පිළිබඳ පුහුණුව ලබා දීම අවශ්‍යය. ඔවුන්ගෙන් බොහෝ දෙනෙකු තම සමීපතම පවුලේ සාමාජිකයන්ට පවා තම වගකීම් හෙළි නොකරන බැවින් ව්‍යාපාර අඛණ්ඩ සැලසුම් සහ තිරසාරභාවය සම්බන්ධයෙන් අසාර්ථක වෙති. ඒ නිසා ඉදිරි වැඩසටහන් ඒ අංශවලින් ද පොහොසත් කළ හැකිය.

අනෙක් අවශ්‍යතාවය වන්නේ සන්නිවේදනය, ජාලකරණය, සමාජ මාධ්‍ය, පාරිභෝගික සම්බන්ධතා කළමනාකරණය, ගෙවීම්, ගිණුම්කරණය සහ මූල්‍ය මෙහෙයුම් සම්බන්ධ ක්ෂුද්‍ර ව්‍යවසායක හිමිකරුවන්ගේ ඩිජිටල් නිපුණතා වැඩිදියුණු කිරීම සහ ව්‍යවසායන්හි ඩිජිටල් දෘශ්‍යතාව වැඩිදියුණු කිරීමයි.

ක්ෂුද්‍ර මට්ටමේ ව්‍යවසායකයින් ලෙස ඔවුන්ගෙන් බහුතරයක් බැංකුවලින් හෝ ස්ථාපිත ආයතනවලින් ණය ලබාගෙන නැත. කෙසේ වෙතත්, එම කාණ්ඩයේ පුද්ගලයින් සිටී නම්, ඔවුන්ගේ ව්‍යාපාර ප්‍රකෘතියේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීමට සහ විභව සෘණාත්මක බලපෑම් අවම කිරීම සඳහා ප්‍රතිකර්ම හඳුන්වා දීමට යාන්ත්‍රණයක් ද ප්‍රයෝජනවත් වනු ඇත.

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ආර්ථිකය නංවාලීම සඳහා ඔවුන් සමඟ අඛණ්ඩව අධ්‍යාපනයක් සමග සම්බන්ධ වීම ප්‍රයෝජනවත් වනු ඇති අතර එය රටේ ආර්ථික ප්‍රකෘතිය වේගවත් කිරීම සඳහා දායක වනු ඇත.

**Right to Life Human Rights Centre**

No. 56/2, Palitha Place, Colombo 09, Sri Lanka.
Tel/Fax : +94 112 669100
Email : right2lifelk@gmail.com
Websites : www.right2lifelanka.org | www.aithiya.lk | www.dailyreporter.lk www.slcat.org
Facebook pages : Right to Life Sri Lanka | Aithiya | Daily Reporter
Youtube : Aithiya Media